


# මෝඩ එඑරාළ

තරුෂි සත්සරණී විජේසිංහ

# මෝඩ චිචිටාළ

තරුෂි සත්සරණී විජේසිංහ

# "මෝඩ එළුරාළ"

කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2023 ඔක්තෝබර්

කතාව සහ චිත්‍ර

**තරුෂි සත්සරණි විජේසිංහ**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විදුහල

ISBN **978 - 624 - 206 - 928 - 9**

## <u>පිදුම</u>

මෙතෙක් මා හට සිප්සතර කියා දුන්

ගුරු මෑණිවරුන්ට හා

මා ආදරයෙන් හදා වඩා ගන්නා

මාගේ දෙමාපියන්ට

මෙම පොත ආදරයෙන්

පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.


2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට පිවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20

දවසක් නරි හාමිට බඩගින්නක් සහ වතුර තිබහක් හැදිලා කැලේ පුරාම ඇවිදලා, මොකුත් හොයාගන්න බැරිවෙලා  ගම පැත්තට ආවා




එහෙම යනකොට නරිහාමි ඈතින් පාළු ළිඳක් තියෙනවා දැක්කා. නරිහාමි ළිඳ ළඟට ආවා. දන්නෙම නැතුව නරිහාමිගෙ පය ලිස්සා ළිඳට වැටුනා.




“ අනේ දැන් මොකද කරන්නෙ ගොඩට එන්න විදිහක් නෑ. අනේ අපොයි මට වෙච්චි දෙයක්.” නරිහාමි කෑගහන්න පටන් ගත්තා. ඒක ඇහිලා ගමේ හිටපු එළුඑරාළ ඇවිත් ළිඳට එබී බැලුවා .



“ආ නරිහාමි මොකද මේ ළිඳ ඇතුලෙ ?”
එළුරාළ ඇහුවා. “ ආ එළුරාළ මම මේ
වතුර බොනවා. මේ ළිඳේ වතුර පැණි
රසයි . ඇවිත් බීලා බලන්නකො ..”
නරිහාමි කිව්වා




එළුඑරාළත් දුරදිග කල්පනා නොකර ළිඳ ඇතුලට පැන්නා.එතකොට නරිහාමි ඉක්මනට එළුඑරාළගෙ පිටට අඩිය තියලා ළිඳෙන් ගොඩට පැන ගත්තා.




“කෝ ළිඳ ඇතුලෙ වතුර ..?” එළුවාරාළ කලබල උනා. “අනේ නරිහාමි කෝ මේ ළිදේ වතුර නෑනෙ ..? කොහොමද ඉතින් මම දැන් ගොඩට එන්නෙ ..?” එළුවාරාළ ඇසුවා.




“ආ ඒක ඉතින් පනින්න කලින් කල්පනා කරන්න තිබුණානේ ...” කියූ නරිහාමි එතනින්  යන්න ගියා.




අනේ අසරණ එළුවරාළ බයේ ළිඳ
ඇතුලට වෙලා කෑගහල අඬන්න
පටන් ගත්තා. ඒත් කවුරුත්ම
එළුවරාළ බේරගන්න ආවෙ නෑ.



එළුරාළ හොඳටම කෑ ගහද්දි එතනට හා පැංචෙක්, මුව පැටියෙක් සහ එළුදෙනක් ආවා.



“ අනේ ඔයා කොහොමද ළිඳ ඇතුලට වැටුණේ.... ?” එළදෙන ඇසුවා.
“නරිහාමිගෙ කපටිකම නිසා තමයි මට මෙහෙම උනේ.” එළුරාළ දුකෙන් කිව්වා
“ අපි දැන් කොහොමද මෙයාව ගොඩට ගන්නෙ . මුව පැටියා කල්පනා කළා.
“ම්ම්ම් හරි අපි ලණුවකින් ඇදල ගමු.” හා පැංචා කිව්වා.




හා පැංචා ගෙනාව ලණුව ළිඳට දාලා, එළදෙන තමන්ගේ ශක්තිය යොදලා, ටික ටික එළුවාරාළ ගොඩට අදින්න පටන් ගත්තා .. "අපොයි" ලණුව කැඩිලා එළුවාරාළ ආයෙමත් ළිඳට වැටුනා.



“අනේ ඔයාට තුවාල උනාද ?.” එළදෙන ඇහුවා. “ආ නෑ නෑ මට කරදරයක් නෑ.” එළුඑරාළ කිව්වා . “ අපි කොහොමද මෙයාට උදව් කරන්නෙ ... මිමි අපි හයියෙන් කෑ ගහමු එතකොට කවුරුහරි එයිනෙ.” මුව පැටියා කිව්වා ... ඊට පස්සෙ හැමෝම හයියෙන් කෑගහන්න පටන් ගත්තා. එතකොට කැලේ ඇතුලෙන් ලොකු ශබ්දයක් ආවා



කැලේ ඇතුලෙ ඉඳලා එකපාරටම
දුවගෙන ආපු අලි මාමා කෙනෙක්
එයාගෙ දිගම දිග හොඬවැල දාල
ළිඳ ඇතුලෙ හිටපු එළුරාළ  ගොඩට
ඇදල ගත්තා.
හැමෝටම හරිම
සතුටුයි.



ඉතින් හැමෝම අලි මාමාට
ගොඩක් ස්තූති කළා.
විශේෂයෙන් එළුවරාළ. මොකද
දන්නවද ? එළුවරාළ හිතුවා ආයෙ
කවදාවත් එයාට ළිඳෙන් එළියට
එන්න නම් බැරි වෙයි කියලා.



ඊට පස්සෙ හැමෝම සතුටින් විසිර ගියා. එළුරාළ හිතුව ආයෙ නම් කවදාවත් මේ වගේ මෝඩ වැඩ නම් කරන්නෙ නෑ කියලා . දෙයක් කරන්න කලින් හොදට කල්පනා කරල බලන්න ඕන කියලා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුලින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20

ISBN 978 - 624 - 206 - 928 - 9